# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2070/12 - 2018 මැයි මස 09 වැනි බදාදා - 2018.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**2016 වසරේ අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තිය**

2016 වසරේ අංක 01 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තියේ 62 වැනි වගන්තිය යටතේ උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන සහ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සංශෝධනය කරන ලද්ද වූ රෙගුලාසි.

**විනිසුරු ක.වි. විග්නේශ්වරන්,**
ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය
හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්
සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම
සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ වාහන
සහ ප්‍රවාහන අමාත්‍ය
උතුරු පළාත් සභාව.

උතුරු පළාත් සභාව,
ඒ - 9 පාර, කයිතඩි, යාපනය.

රෙගුලාසි

2017 වසරේ මැයි මස 15 වැනි දිනැති හා අංක 2019/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද්ද වූ උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන රෙගුලාසි 2018.02.01 වැනි දින සිට ක්‍රියාත්මක වන අයුරින් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. එහි 3 වැනි රෙගුලාසියට අනුකූලව දැක්වෙන II වැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන II වැනි උපලේඛනය ආදේශ කිරීමෙන් :


1A PG 4033 — 12 (2018/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## II වැනි උපලේඛනය

### *අධිකාරිය විසින් නිර්ණය කරන ලද ගාස්තු*

මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ දක්වෙන යම් කාර්යයක් සඳහා ගෙවීම් කළ යුතු මුදල මෙහි උපලේඛනයේ II වැනි තීරුවේ ඊට අනුරූප සටහනෙහි දක්වෙන මුදල විය යුතුය.

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | අවසර පත්‍රයක් සඳහා අයදුම්පතක ගාස්තුව | 1,000.00 |
| 2. | තාවකාලික අවසර පත්‍රය නිත්‍ය කිරීම සඳහා – | |
| | i. කි. මී. 1 සිට කි. මී. 25 දක්වා | 50,000.00 |
| | ii. කි. මී. 26 සිට කි. මී. 50 දක්වා | 75,000.00 |
| | iii. කි. මී. 51 සිට කි. මී. 75 දක්වා | 100,000.00 |
| | iv. කි. මී. 76 සිට කි. මී. 100 දක්වා | 125,000.00 |
| | v. කි. මී. 101 ට වඩා වැඩි | 150,000.00 |
| 3. | අළුතින් අවසර පත්‍රයක් නිකුත් කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුකූලව වේ. | |
| 4. | මගී සේවා අවසර පත්‍රයක් අළුත් කිරීමේ ගාස්තුව | |
| | i. අළුත් කිරීමේ ගාස්තුව (කල් පිරෙන දිනය තුළ) | 7,500.00 |
| | ii. අළුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත් වූ දිනයේ සිට දින 7 ක් ඇතුළත) | 10,500.00 |
| | iii. අළුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත් වූ දිනයේ සිට දින 7 කට පසුව මසක් ඇතුළත) | 12,500.00 |
| | iv. අළුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත් වූ දිනයේ සිට මසකට පසුව මාස දෙකක් ඇතුළත) | 17,500.00 |
| | v. අළුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත් වූ දිනයේ සිට මාස දෙකකට පසුව මාස තුනක් ඇතුළත) | 22,500.00 |
| | vi. අළුත් කිරීමේ ගාස්තුව (කල් ඉකුත් වූ දිනයේ සිට මාස තුනකට පසුව මාස හයක් දක්වා) සෑම මසක් සඳහාම රුපියල් 5,000.00 ක් බැගින් | |
| 5. | මගී සේවා අවසර පත්‍රයේ පිටපතක් ලබාගැනීම (පළුදුවීම) | 2,500.00 |
| 6. | මගී සේවා අවසර පත්‍රයේ පිටපතක් ලබාගැනීම (නැතිවීම/අස්ථානගත වීම) | 5,000.00 |
| 7. | මගී සේවා අවසර පත්‍රයේ ඉදිරිපස වීදුරුවේ ලේබලයේ පිටපතක් ලබාගැනීම (පළුදුවීම) | 2,000.00 |
| 8. | මගී සේවා අවසර පත්‍රයේ ඉදිරිපස වීදුරුවේ ලේබලයේ පිටපතක් ලබාගැනීම. (නැතිවීම/අස්ථානගත වීම) | 2,500.00 |
| 9. | විශේෂ චාරිකා අවසර පත්‍රය - එක් දවසකට | 200.00 |
| 10. | තාවකාලික අවසර පත්‍රය - එක් දවසකට | 200.00 |
| 11. | ගමන් මග අවසර පත්‍රයක හිමිකාරිත්වය මාරු කිරීම | 100,000.00 |
| 12. | අවසරපත්‍රලත් අවසරපත්‍රධාරියෙකු මිය ගියහොත් නීත්‍යානුකූල පසු අයිතිකරු (භාර්යාව හෝ ස්වාමි පුරුෂයා හෝ දරුවන්) වෙත එම අවසර පත්‍රය අතමාරු කිරීම | අය නොකෙරේ. |
| 13. | පවුලේ සාමාජිකයන් අතර අවසර පත්‍රය අතමාරු කිරීම (භාර්යාව හෝ ස්වාමි පුරුෂයා හෝ දරුවන්) | 50,000.00 |
| 14. | බස් රථයක වේලා කාල සටහනේ අනු පිටපතක් නිකුත් කිරීම. | 100.00 |
| 15. | හිමිකරුවන්ගේ ඉල්ලීම් මත (අධිකාරිය එකඟවන අවස්ථාවක) වේලා කාල සටහන සංශෝධනය කිරීම බස් රථයක් සඳහා | 250.00 |
| 16. | අතිරේක ගාස්තු චක්‍රයක් නිකුත් කිරීම | 50.00 |
| 17. | බස් රථයක් මාරු කිරීමේ ගාස්තුව | 10,000.00 |
| 18. | ගමන් මග මාරු කිරීමේ ගාස්තුව | 25,000.00 |
| 19. | මාසික ධාවන සටහන් පත්‍රයක් නිකුත් කිරීම (පළාත තුල) | 750.00 |
| 20. | ප්‍රවේශවීමේ ගාස්තු චක්‍රයක් නිකුත් කිරීම (පළාත් අතර) | 1,500.00 |
| 21. | මාසික ධාවන සටහන් පත්‍රය ලබාගැනීමට ප්‍රමාද වීම (මසකට 30% ක් අතිරික්තව ගෙවිය යුතුය) | |
| 22. | අධිකාරිය විසින් බස් රථය පරීක්ෂා කිරීම | 2,000.00 |
| 23. | අවසර පත්‍ර පොතේ සංශෝධන කිරීම | 1,000.00 |
| 24. | රියදුරු සහ කොන්දොස්තර වෘත්තීය අවසර පත්‍ර ලබාගැනීම | 2,500.00 |

II වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

2. මෙම රෙගුලාසියේ 20 වැනි ඡේදය ඉවත් කර, ඒ වෙනුවට 20(1) සහ 20(2) යන නව ඡේද ආදේශ කිරීමෙන්,

20.1 මෙහි මතුවට දක්වෙන V වැනි උපලේඛනයේ සඳහන් තහවුරු කරනු ලබන වරදවල් උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙකු ඊට අනුරූපව දක්වෙන දඩුවම්වලට යටත් විය යුතුය.

20.2 20.1 න් සඳහන් නොකළ, එනම් V වැනි උපලේඛනයේ සඳහන්ව නොමැති සෙසු රෙගුලාසියේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් දාහදාහකට නොවැඩි දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතු වන්නේ ය.

3. පහත දක්වෙන V වැනි නව උපලේඛනය ඇතුළත් කිරීමෙන්,

**V වැනි උපලේඛනය**

| අනු අංක | වරදේ ස්වභාවය | 1 වැනි වතාව | 2 වැනි වතාව | 3 වැනි වතාව | 4 වැනි වතාව | 5 වැනි වතාව |
|---|---|---|---|---|---|---|
| 1. | මගී අසීමිත රක්ෂණ සහතිකය නොමැතිව සේවය කිරීම. | මගී සේවා අවසර පත්‍රය අවලංගු කිරීම. | | | | |
| 2. | කල් ඉකුත් වූ (මසකට වැඩි) ගමන් මග අවසර පත්‍රය සමගින් සේවය කිරීම. | අවවාද කරනු ලැබීමත් සමග රු. 2,500.00 ක දඩ මුදල ගෙවීම. | මගී සේවා අවසර පත්‍රය අවලංගු කිරීම. | | | |
| 3. | වැඩි මුදලක් අය කිරීම. | | | | | |
| 4. | ගාස්තු චක්‍රය බස් රථයේ ප්‍රදර්ශනය නොකර තිබීම. | | | | | |
| 5. | මගී සේවයට නුසුදුසු වාහනය සේවයේ යෙදවීම. | | | | | |
| 6. | බලයලත් නිලධාරියාව අවමන් කිරීම. | | | | | |
| 7. | මගීන් සමග තදින් ගැටීම. | | | | | |
| 8. | කල් ඉකුත් වූ (මසක් තුළ) ගමන් මග අවසර පත්‍රය සමගින් සේවය කිරීම. | අවවාද කරනු ලැබීමත් සමග රු. 1,500.00 ක දඩ මුදල ගෙවීම. | අවවාද කරනු ලැබීමත් සමග රු. 3,000.00 ක දඩ මුදල ගෙවීම. | මගී සේවා අවසර පත්‍රය අවලංගු කිරීම. | | |
| 9. | වේලා කාලසටහන අනුගමනය නොකිරීම. | | | | | |
| 10. | අදාළ බලධාරීන් ලියකියවිලි පරීක්ෂා කිරීමට ඉල්ලා සිටි අවස්ථාවක එය ප්‍රතික්ෂේප කිරීම. | | | | | |
| 11. | නියමිත ගමන් මග අවසර පත්‍රයක් නොමැතිව එම මාර්ගවල සේවයේ යෙදීම. | | | | | |
| 12. | ගාස්තු චක්‍රයේ සඳහන් මුදලට වඩා වැඩි මුදලක් අය කිරීම. | | | | | |
| 13. | ලියාපදිංචි නොකළ රියදුරු සහ කොන්දොස්තර සේවයේ නිරතවීම. | | | | | |
| 14. | වාහනයේ යෝග්‍යතාවය සහ පිරිසිදුභාවය නොපවත්වා ගැනීම. | | | | | |
| 15. | මගීන් සමග ගැටීම. | | | | | |

V වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| අනු අංක | වරදේ ස්වභාවය | 1 වැනි වතාව | 2 වැනි වතාව | 3 වැනි වතාව | 4 වැනි වතාව | 5 වැනි වතාව |
|---|---|---|---|---|---|---|
| 16. | අනුමත නොකළ මාර්ගවල සේවයේ යෙදීම. | අවවාද කරනු ලැබීමත් සමඟ රු. 500.00 ක දඩ මුදල ගෙවීම. | අවවාද කරනු ලැබීමත් සමඟ රු. 1,000.00 ක දඩ මුදල ගෙවීම. | අවවාද කරනු ලැබීමත් සමඟ රු. 2,500.00 ක දඩ මුදල ගෙවීම. | අවවාද කරනු ලැබීමත් සමඟ රු. 3,000.00 ක දඩ මුදල ගෙවීම. | මගී සේවා අවසර පත්‍රය අවලංගු කිරීම. |
| 17. | නියමිත ගමනාන්තය අවසන්වන තෙක් සේවයේ නොයෙදී සිටීම. | | | | | |
| 18. | විශේෂ අවසර පත්‍රයක් ලබා නොගෙන විශේෂ සේවයේ නිරතවීම. | | | | | |
| 19. | නියමිත ලියකියවිලි වාහනයේ තබා නොගෙන තිබීම. | | | | | |
| 20. | ආරම්භවන ස්ථානය, අවසන්වන ස්ථානය හා මාර්ග අංක වාහනයේ ප්‍රදර්ශනය නොකර තිබීම. | | | | | |
| 21. | අනුමතකළ ආසනවලට වඩා අඩු හෝ වැඩි හෝ ආසන සමගින් සේවයේ නිරතවීම. | | | | | |
| 22. | සීනුව නොමැතිවීම හෝ ක්‍රියා විරහිතව තිබීම. | | | | | |
| 23. | වාහනය ඇතුළත දුම්බීම තහනම් බව ප්‍රකාශිත දැන්වීමක් නොමැතිවීම. | | | | | |
| 24. | පූජ්‍ය පක්ෂය, ආබාධිතයින් හා ගර්භනී මව්වරුන් සඳහා ආසන වෙන් නොකර තිබීම. | | | | | |
| 25. | වෙනත් සුළු වැරදි | | | | | |
| 26. | අනුමත කළ මගීන්ට වඩා මගීන් වැඩි ගණනක් නංවාගෙන යාම. | මගීන් 1 - 3 නම් රු. 500.00 ද, මගීන් 4-6 දක්වා නම්, රු. 1,000.00 ද, මගීන් 6 කට වැඩි නම්, එක් මගීයෙකුට රු. 200.00 බැගින් ද ගෙවීම. | අවවාද කරනු ලැබීමත් සමඟ 1 වැනි වතාවේ දඩ මුදලේ එකහමාරක ගුණයක් ගෙවීම. | අවවාද කරනු ලැබීමත් සමඟ 1 වැනි වතාවේ දඩ මුදලේ දෙගුණයක් ගෙවීම. | මගී සේවා අවසර පත්‍රය අවලංගු කිරීම. | මගී සේවා අවසර පත්‍රය අවලංගු කිරීම. |

05 - 588

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.